# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2332/04 - 2023 මැයි මස 15 වැනි සඳුදා - 2023.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1987 අංක 42 දරන පාළාත් සභා පනත**

32 (2අ) වන වගන්තිය යටතේ වූ නියමය

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (2අ) වන උපවගන්තියෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින්, මා වෙත පවරා දී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති උදය රොහාන් ද සිල්වා වන මා විසින්, මේ නියමය මගින් එම පනත යටතේ සාදන ලද 2018 ජූලි 31 වන දින අංක 2082/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛන අංක 05 සහ අංක 07 ඉවත්කර, ඒ වෙනුවට පහත උපලේඛන ආදේශ කිරීමෙන් එකී නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**" උපලේඛන අංක 05**

| *I තීරුව*<br>*බලතල පවරනු ලබන නිලධරයන්* | *II තීරුව*<br>*නිලධාරී ගණය* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 1. පළාත් පාලන ලේකම් (ඉහත උපලේඛන අංක 03 හි බලතල වලට අමතරව) | (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධාරියා වන, පළාත් පාලන ආයතනවල SL වැටුප් බණ්ඩය දරන නිලධාරීන් | (අ) අමාත්‍යාංශය, පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම<br>(ආ) සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |

1A - PG 6322 — 07 (2023/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"උපලේඛන අංක 05 (සම්බන්ධිතයි)

| *I තීරුව*<br>*බලතල පවරනු ලබන නිලධරයන්* | *II තීරුව*<br>*නිලධාරී ගණය* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | (II) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව තෘතීය මට්ටමට අයත් බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර අධිශ්‍රේණියේ නිලධාරීන් | (අ) ප්‍රාදේශීය සභාවල ලේකම් තනතුරුවල ස්ථාන ගත කිරීම්<br>(ආ) පළාත් පාලන ආයතනවල පරිපාලන නිලධාරි තනතුරුවල ස්ථානගත කිරීම්<br>(ඇ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුව හා ආයතන අතර ස්ථාන මාරු කිරීම<br>(ඈ) සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |
| | (III) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව තෘතීය මට්ටමට අයත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධාරියා වන පළාත් පාලන ආයතනවල MN 7 වැටුප් බණ්ඩය දරන නිලධාරීන් (බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ නිලධාරීන් හැර) | (අ) සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |
| 2. පළාත් පාලන කොමසාරිස් | (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව තෘතීය හා ද්විතීය මට්ටම්වලට අයත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධාරියා වන තනතුරුවල නිලධාරීන් ( SL හා MN 7 වැටුප් බණ්ඩ හැර) | (අ) සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |
| | (II) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව ප්‍රාථමික මට්ටමට අයත් PL වැටුප් බණ්ඩය දරන තනතුරුධාරීන් | (අ) සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |
| | (III) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව ප්‍රාථමික මට්ටමට අයත් පළාත් පාලන ආයතනවල ප්‍රධාන පරිපාලන නිලධාරියා පත්වීම් බලධාරියා වන තනතුරුධාරීන් | (අ) විශේෂ විධිවිධාන ඇති කල්හි තනතුරුධාරීන්ගේ හා අදාළ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ එකඟතාවය මත වෙනත් පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම |

**උපලේඛන අංක 07**

| I තීරුව<br>බලතල පවරනු ලබන නිලධරයන් | II තීරුව<br>නිලධාරී ගණය | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 1. පළාත් සෞඛ්‍ය ලේකම් (ඉහත උපලේඛන අංක 03 හි බලතලවලට අමතරව) | (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව තෘතීය මට්ටමට අයත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධාරියා වන<br><br>i MP වැටුප් බණ්ඩය දරන නිලධාරීන් | (අ) පළාත තුළ ස්ථාන මාරු කිරීම<br><br>(ආ) සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |
| 2. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>3. පළාත් ආයුර්වේද කොමසාරිස් | (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව තෘතීය ද්විතීය සහ ප්‍රාථමික මට්ටම්වලට අයත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධාරියා වන තනතුරුවල නිලධාරීන් (MP වැටුප් බණ්ඩය හැර) | (අ) සෞඛ්‍ය/ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය සේවාවට අයත් බඳවා ගැනීමේ ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |
| | (II) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව ප්‍රාථමික මට්ටමට අයත් PL වැටුප් බණ්ඩය දරන තනතුරුධාරීන් | (අ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව තුළ දිස්ත්‍රික් අතර ස්ථාන මාරු කිරීම.<br><br>(ආ) පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පළාත තුළ ස්ථාන මාරු කිරීම.<br><br>(ඇ) සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |
| 4. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව ප්‍රාථමික මට්ටමට අයත් PL වැටුප් බණ්ඩය දරන තනතුරුධාරීන් | (අ) තම දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරුකිරීම |

**උදය රොහාන් ද සිල්වා,**
ජනාධිපති නීතිඥ,
සභාපති,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2023 පෙබරවාරි 28 වැනි දින,
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 628, 10 වන මහළ,
ජන ජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

EOG 05 - 0109

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.